**ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - 2016**

**---------------------------------------------------------------------------**

ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී.ලං.ර) සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල (ජ.සං.ඔ.අ) අතර 2012 ඔක්තෝබර් 08 දින එළඹී අංක 1452 පී දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 <u>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය</u>**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග හා නාවික කටයුතු අමාත්‍යාංශය ද වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවේ මූලික කොටසක් ලෙස ජාතික මහාමාර්ග කිලෝමීටර් 202 ක් වැඩිදියුණු කිරීම මඟින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඉල්ලුමට සරිලන පරිදි මාර්ග ජාලයේ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම මෙන්ම බස්නාහිර, වයඹ, උතුරුමැද, මධ්‍යම, දකුණ හා සබරගමු පළාත්වල පාලම් ප්‍රතිසංස්කරණය කිරීම හා පුළුල් කිරීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වූ ඇ.එ.ජ.ඩොලර් මිලියන 62.21 කට සමාන රු.මිලියන 7,092.77 කට සමාන වන අතර ඉන් එ.ජ.ඩො. මිලියන 40 කට සමාන රු.මිලියන 4,560 ක මුදල ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල විසින් ලබාදීමට එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජනවාරි 16 දින ආරම්භ කරන ලද අතර 2017 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිත විය.

**1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 <u>විගණකගේ වගකීම</u>**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත්

පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

**(අ)** අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

**(ආ)** ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සන්සන්දනය කර ඇති බව,

**(ඇ)** ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයන්ගෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණාත්මක ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

**(ඈ)** ණය යටතේ කරන ලද ආපසු ගැනීම්, ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව,

**(ඉ)** ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

**(ඊ)** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව

**(උ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

**(ඌ)** මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව සහ

**(එ)** ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**2.1 <u>මතය</u>**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

**(අ)** 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

**(ආ)** සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබූ බව,

**(ඇ)** ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

**(ඈ)** මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබූ බව, සහ

**(ඉ)** ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**3. <u>මූල්‍ය සහ භෞතික කාර්යසාධනය</u>**

**3.1 <u>අරමුදල් උපයෝජනය</u>**

අරමුදල් මූල්‍යයනය, අයවැය ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂයේ අරමුදල් උපයෝජනය හා 2016 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් පිළිබඳ වැදගත් දත්ත කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2016 වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | ඇ.ඩො. මිලියන | රු. මිලියන | ඇ.ඩො. මිලියන | රු. මිලියන |
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහාවූ ඔපෙක් අරමුදල | 40.00 | 4,560.00 | 1,000.00 | 5.90 | 860.46 | 30.65 | 4,299.57 |
| ශ්‍රී ලංකා රජය | 22.21 | 2,532.77 | 100.00 | - | 62.63 | - | 159.27 |
| එකතුව | 62.21 | 7,092.77 | 1,100.00 | 5.90 | 923.09 | 30.65 | 4,458.84 |

**3.2 භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘතියේ කාර්ය සැලසුම් වලට අනුව, මධ්‍යම, දකුණ, සබරගමුව සහ බස්නාහිර පළාත්වල කිලෝමීටර් 63.89 ක ජාතික මාර්ග 07 ක් සහ සබරගමුව පළාතේ කෑගල්ල - පොල්ගහවෙල මාර්ගයේ අංක 3/2 දරන පාලම් පුනරුත්ථාපන වැඩ නිමකිරීමට එමඟින් නියමිත විය. කෙසේවෙතත්, 2016 දෙසැම්බර් 31 දිනට සබරගමුව සහ මධ්‍යම පළාත්වල කිලෝමීටර් 36.57 මාර්ග පුනරුත්ථාපන වැඩ පමණක් නිම කර තිබුණි. එසේනමුත්, පේරාදෙණිය බදුල්ල චෙන්කලාඩි මාර්ගයේ කිලෝමීටර් 0+420 සිට කිලෝමීටර් 3+050 කොටසේ පුනරුත්ථාපන වැඩ සඳහාවූ කොන්ත්‍රාත්තුව ව්‍යාපෘතියේ ආරම්භක දිනයේ සිට මාස 41 ක් ඉකුත්වීමෙන් පසුව 2017 ජූනි 02 දින පිරිනමා තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

පොල්ගහවෙල - කෑගල්ල මාර්ගයේ කිලෝමීටර් 11.7 ක් පුනරුත්ථාපන වැඩවල අවශ්‍යතාවය මූලික අදියරයේදී හඳුනාගෙන තිබුණු අතර රු. මිලියන 2.02 ක මුදලක් මැනුම් ගාස්තු හා දිරි දීමනා ආදී වශයෙන් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. එසේවුවද, 2017 ජූනි 30 වන විටත් මාර්ග පුනරුත්ථාපන වැඩ ආරම්භ කර නොතිබුණි.

**3.4 මතභේදාත්මක ස්වභාවයේ කරුණු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ගාල්ල - දෙණියාය - මාදම්පේ මාර්ගය සහ රක්වාන සිට මාදම්පේ මාර්ගයේ පුනරුත්ථාපන වැඩවල නිරතවූ කොන්ත්‍රාත්කරු විසින්, පුනරුත්ථාපනය කරන ලද මාර්ග 2015 සැප්තැම්බර් 26 දින මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණද, රු.මිලියන 245 ක අමතර වන්දි පූර්ණයක් භාරදී තිබුණි. තවද, උපදේශන සේවා සඳහා වූ කොන්ත්‍රාත්තුවද 2016 ජූනි 30 වන විට නිමකර තිබුණි.

**(ආ)** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැතිව ස්වකීය ව්‍යාපෘති සඳහා බඳවා ගන්නා ලද දේශීය උපදේශකයින් හට වේතන හා දීමනා පිරිවැය සපුරාලීම සඳහා රු.මිලියන 1.55 ක මුදලක් වෙනත් ව්‍යාපෘතියකට මාරු කර තිබුණි.